**ශීර්ෂය 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 වර්ෂයේ අයවැය යෝජනාවක් වූ ක්ෂේත්‍ර නිලධාරීන් හට යතුරුපැදි ලබාදීමේ වැඩසටහනට අදාළව යතුරුපැදි සඳහා වූ මූලික ගෙවීම, බදු නොවන ආදායමක් ලෙස දෙපාර්තමේන්තුව විසින් 2003.04.00 දරන ආදායම් සංකේතාංකයට ගිණුම්ගත කර තිබූ අතර එසේ ලබා දුන් සියළුම යතුරුපැදි 2020 වර්ෂය අවසාන වන විට අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික අයිතියට පැවරී අවසාන විය යුතුව තිබුණි. එසේ වුවද 2023 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ වශයෙන් අයකර ගත යුතු මුදල නිශ්චිතව තහවුරු ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණු අතර 2023 වර්ෂයේදී රු.490,386 ක ශුද්ධ ආදායමක් ලැබී තිබුණි. | මෙම ගැටළුව කඩිනමින් නිරාකරණය සඳහා වෙන වෙනම ආයතන ප්‍රධානීන්/ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් පරීක්ෂා කිරීම තව දුරටත් කරගෙන යනු ලැබේ. එමෙන්ම මෙම යතුරුපැදි පවරා ගැනීමට කටයුතු කඩිනම් කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | විධිමත් උපදෙස් හා මඟපෙන්වීම් සිදුකරමින් හිඟ ආදායම් රැස්කර ගැනීමට කඩිනමින් කටයුතු කළයුතු වීම. |

### 2.2. වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයන් 8 ක් හා මූලධන වැය විෂයයන් 2 ක් වෙනුවෙන් අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 89 ක් අතර පරාසයක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. | ප්‍රධාන වශයෙන් රටේ පැවතුන අයහපත් හා අනපේක්ෂිත ආර්ථික තත්වය තුළ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හා දැඩි වියදම් පාලනය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 03/2022 හා 01/2023 ට අනුගතව, සැලසුම් කළ කාර්යයන් ප්‍රමුඛතා ගතකිරීම, අත්‍යාවශ්‍යම මිලදී ගැනීම් හැර අනෙකුත් සියලු මිලදීගැනීම් අත්හිටුවීම, ඇතැම් වියදම් කල් දැමීම වැනි ක්‍රියාමාර්ග තුලින් වියදම් දැඩිව පාලනය කිරීමට අභ්‍යන්තරව උපදෙස් ලබාදීම හේතුවෙන් මෙලෙස ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මු.රෙ.50 ප්‍රකාරව වැය විෂයන් සඳහා තාත්වික ලෙස වියදම් ඇස්තමේන්තු කළයුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 1980 ජූලි වැඩ වර්ජනයට සහභාගි වී රැකියා අහිමිවූවන්ට සහන සැලසීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1980 ජූලි වැඩ වර්ජනයට සහභාගි වී රැකියා අහිමිවූ ස්ථිර ජීවනෝපාය මාර්ගයක් නොමැති වූ වයස අවුරුදු 65 සම්පූර්ණ වූ පුද්ගලයන්ට සහන සැලසීම සඳහා දීමනාවක් ලබාදීමට අයවැය යෝජනා මඟින් 2013 වර්ෂයේ සිට අනුමත වී තිබුණි. ඒ අනුව 2013 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා මසකට රු.5,000 බැගින් ද, 2015 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා මසකට රු.6,000 බැගින් ද, 2015 දෙසැම්බර් 31 දිනෙන් පසුව එක්වරක් පමණක් ගෙවනු ලබන රු.250,000 ක දීමනාවක් ද ලබා දීමට තීරණය කර තිබුණි. එසේ වුවද විගණනය විසින් මේ පිළිබඳව අඛණ්ඩව පෙන්වා දී තිබුණද දෙපාර්තමේන්තුව විසින් මේ සඳහා හිමිකම් ලබන්නන් නිශ්චිතව හඳුනා ගැනීමට හා අපේක්ෂිත ආකාරයට යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, 2023 වර්ෂයේදී ප්‍රතිලාභීන් 4 දෙනෙකු සඳහා රු.1,673,000 ක් ගෙවීම් කර තිබුණි. | 2013 වර්ෂයේ අයවැය යෝජනාවක් වූ මෙම අයවැය යෝජනාවට පදනම් කරගෙන ඇත්තේ එවකට මුදල් අමාත්‍යාංශය හා කම්කරු අමාත්‍යාංශය, වෘත්තීය සමිති සමඟ එවකට පැවති සාකච්ඡාවලදී අනාවරණය වූ තොරතුරු බව නිරීක්ෂණය වේ. එම තොරතුරු අනුව 1980 ජූලි වැඩ වර්ජනයෙන් රැකියා අහිමි වී ස්ථිර ජීවනෝපායක් නොමැති වූවන් 10,000 ක පමණ පිරිසක් සිටින බවට වාර්තා වී ඇති බව ගොනුව අනුව නිරීක්ෂණය වී ඇත. මෙම වැඩසටහන යටතේ ගෙවීම් සිදු කිරීමේදී 1980 ජූලි වර්ජනයට සහභාගී වී රැකියා අහිමි වූවන්ගේ ඉල්ලීම්, ප්‍රාදේශීය ලේකම් විසින් ලබාදෙන නිර්දේශ පදනම් කර ගනිමින් එවකට මෙම සේවකයින් සේවා කරන ලද විෂය භාර අමාත්‍යාංශ වන කම්කරු, ප්‍රවාහන, කර්මාන්ත, හා නිවාස යන අමාත්‍යාංශවල නිර්දේශ අනුව සිදු කිරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ. | අයවැය යෝජනා වලින් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට අදාළව විධිමත් සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

### 3.2 පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තු මඟින් කිසිදු ප්‍රතිපාදනයක් සලසා ගැනීමකින් තොරව, 2022 මාර්තු 31 දින සිට 2022 ජූලි 22 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ රට තුළ පැවති අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික දේපළ වලට සිදු වූ හානි සම්බන්ධයෙන් 2022 අංක 43 දරන | අමප අංක 23/0732/601/010- III දරන 2023.04.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව බල අංක 186 හා 2023.05.09 දිනැති ලිපිය මගින් රු. මිලියන 714 නිකුත් කරන ලදී. තවද අමප අංක 23/1683/605/035- I දරන 2023.09.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව හානිපූරණයන් | තක්සේරු ගත වන්දිය පූර්ව හඳුනාගෙන වාර්ෂික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| විසර්ජන පනතේ 6(1) වගන්තියේ සඳහන් පරිපූරක සහය සේවා සහ හදිසි අවස්ථා වගකීම් වැය විෂයෙන්, ශීර්ෂය 130 රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට පරිපූරක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබා දී එකී අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 41 දෙනෙක් වෙනුවෙන් එකතුව රු.1,050,339,626 ක් හානිපූරණය වශයෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කර තිබූ බව නිරීක්ෂණය විය. | සිදුකිරීම වෙනුවෙන් ඉදිරියේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ගෙවීම් සිදුකිරීමට රු.මි.700 ක අතිරේක ප්‍රතිපාදන ලබාදෙන මෙන් භාණ්ඩාගාර ලේකම්ට නියම කර ඇත. ඒ අනුව තත්‍ය අවශ්‍යතාවය මත බල අංක 341 මගින් 2023.10.04 දිනැති ලිපිය මගින් රු. මිලියන 300 ක අතිරේක ප්‍රතිපාදන ලබා දී ඇත. ඊට අමතරව, 130-01-12-002-1508 වැය විෂය සඳහා රු.මි. 42 ක් සහ රු.මි. 24 ක් මු.රෙ. 66 මගින් පිළිවෙලින් 2023.12.12 දින සහ 2023.12.28 දින මාරු කර ඇත.<br><br>ඒ අනුව, රු. මිලියන 1,080 ක ප්‍රතිපාදනයක් මෙම වියදම දැරීමට සලසා දී ඇති අතර එයින් රු. මිලියන 1,056 ක වියදම් දරා තිබෙන බව නිරීක්ෂණය කරන අතර එම පරිපූරක ප්‍රතිපාදන සලසා දීම් පිළිබඳ 2023 වර්ෂයට අදාළ විසර්ජන පනතේ 6 (i) විධිවිධාන අනුව පාර්ලිමේන්තුව වෙත නියමිත පරිදි වාර්තා කර ඇත. | |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 08 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 14 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 09 ක් ද ලෙස එකතුව පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 31 ක් පැවතුණ අතර, ජ්‍යෙෂ්ඨ හා ද්විතියික මට්ටමේ පුරප්පාඩු පිරවීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | දැඩි වියදම් පාලනය හා බඳවාගැනීම්/ පුරප්පාඩු පිරවීම අත්හිටුවීම සම්බන්ධයෙන් නිකුත්කරන ලද විවිධ උපදෙස් මෙම තත්වයට හේතු වී ඇත. මේ වන විට ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු අතුරින් රියදුරු පුරප්පාඩු සම්පූර්ණ කර ඇති අතර, කාර්යාල කාර්ය සහායක පුරප්පාඩු 03 ක් සම්පූර්ණ කර ඇත. ඒ අනුව තවදුරටත් ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 04 ක් පවතින අතර, ඒ වෙනුවෙන් සේවකයින් අනුයුක්ත කර ගැනීමට පුරප්පාඩු ලිපි නිකුත් කර තිබේ. ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු වෙනුවෙන් ද නිලධාරීන් අනුයුක්ත කර ගැනීමට ලිපි නිකුත් කර තිබේ. | පුරප්පාඩු පියවීම හෝ කාර්ය මණ්ඩල සංශෝධනය කළ යුතු වීම. |